# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2464/31 - 2025 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2025.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ඩී.සීඑෆ්. 1/64.

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ජනාධිපති.

2025 නොවැම්බර් මස 28 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**I වන කොටස**

***සාමාන්‍ය***

2. (1) යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් යම් අර්ථ නිරූපණයක් ප්‍රකාශිතව ම එහි සඳහන් කර ඇත්නම් මිස හෝ එය එහි අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම සඳහන් කර ඇත්නම් මිස හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස- අර්ථ නිරූපණය

"නීතිපතිවරයා" යන්නට, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් වන විට, සොලිසිටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයකු,

රජයේ අධිනීතිඥවරයකු හෝ, එම නියෝගයේ කාර්යය සඳහා නීතිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම් නීතිඥවරයකු ද ඇතුළත් වේ ;

"නිසි බලධරයා" යන්නෙන්, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් වන විට, එම නියෝගයේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, එම නියෝගයේ කාර්යය සඳහා නිසි බලධරයකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ ;

"හදිසි අවස්ථා නියෝගය" යන්නෙන්, මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ වෙනත් යම් නියෝග අදහස් වේ ;

"අත්‍යවශ්‍ය සේවාව" යන්නෙන්, මහජන උපයෝගීතාවයෙන් යුතු වන්නා වූ හෝ ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ ජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය වූ යම් සේවාවක් අදහස් වන අතර, ඊට යම් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ද ඇතුළත් වේ ;

"පොලිස්පතිවරයා" යන්නට, යම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සහ නියෝජ්‍ය පොලිස්පතිවරයකු ද ඇතුළත් වේ ;

"ඉඩම" යන්නට, ජලයෙන් වැසුනු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදාවක සාමාජිකයකු අදහස් වේ ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

"අධිග්‍රහණය කර ගැනීම" යන්න, යම් දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ දේපළවල සන්තකය ලබාගැනීම හෝ අධිග්‍රහණයට ගැනීමේ බලධරයාට කැමැත්තක් කිරීම සඳහා ඒ දේපළ ඔහුට භාරදෙන ලෙස නියම කිරීම අදහස් වේ. තවද එහි ව්‍යාකරණ ප්‍රභේද හෝ සජාතීය පාඨ ඒ අනුව තේරුම් ගතයුතුය;

"ආරක්ෂක විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන්නට, ආරක්ෂක විෂයයභාර අමාත්‍යාංශයේ යම් අතිරේක ලේකම්වරයෙක් ද ඇතුළත් වේ ;

"ශ්‍රී ලංකාව" යන්නට, එහි දේශීය ජලතීරය සහ ගුවන් අවකාශය ද ඇතුළත් වේ ;

"යාත්‍රාව" යන්නට, සෑම වර්ගයකම බෝට්ටු, ඔරු, පහුරු හා යාත්‍රා විශේෂ ඇතුළත් වේ ;

(2) (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනත, යම් පනතක හෝ ආඥාපනතක හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක හෝ අර්ථ නිරූපණය සඳහා අදාළ වන පරිද්දෙන් ම, යම් හදිසි අවස්ථා නියෝගයක් සහ ඒ යටතේ සාදන ලද යම් නියම හෝ රීති අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් යම් ලේඛනයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කර ඇති යම් සඳහනක්, ඉන් පටහැනි අදහසක් පෙනෙන්නේ නම් මිස, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් තදනන්තර නියෝගයකින් සංශෝධිත පරිදි ඒ නියෝගය සම්බන්ධයෙන් කරන ලද සඳහනක්, ලෙස තේරුම් ගත යුතු ය.

(4) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ හෝ සාදනු ලැබූ යම් විධානයක හෝ ආඥාවක කාලසීමාවක් නිශ්චිතව දැක්විය යුතු යයි එම නියෝගයෙන් නියම කර ඇත්තා වූ ද, *නැතහොත්* එසේ නිශ්චිතව දැක්වීමට එම නියෝගයෙන් ඉඩ සලස්වා ඇත්තා වූ ද එවැනි යම් කාලසීමාවක් එම විධානයෙන් හෝ ආඥාවෙන් නිශ්චිතව දක්වා නොමැත්තා වූ ද අවස්ථාවක, එම කාලසීමාව, එම විධානය හෝ ආඥාව හෝ කරනු ලැබුවේ හෝ සාදනු ලැබුවේ යම් නියෝගයක් යටතේ ද එම නියෝගය බලාත්මකව පවතින කාලසීමාව වශයෙන් සැලකිය යුතු ය.

හදිසි අවස්ථා බලතල ජනාධිපතිවරයාගේ අනෙකුත් බලතල වලට අමතරව විය යුතු බව

3. අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරනු ලැබූ බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් යම් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීතිය මගින් සතු කරන ලද හෝ පවරනු ලැබූ වෙනත් යම් අයිතිවාසිකම් හෝ බලතලවලට අමතරව විය යුතු අතර එම අයිතිවාසිකම් හෝ බලතල හීන කිරීමක් නොවිය යුතු ය.

4. යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් ජනාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ යම් අමාත්‍යවරයකු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

හදිසි අවස්ථා නියෝග යටතේ ජනාධිපතිවරයාගේ බලතල යම් අමාත්‍යවරයකු වෙත පැවරීම

5. (1) ජනාධිපතිවරයා විසින්, යම් හදිසි අවස්ථා නියෝගයක කාර්ය සඳහා යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් නිසි බලධරයා වශයෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ තැනැත්තා පත්කරනු ලබන ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා පත්කරනු ලැබිය හැකි ය. තවද, ඒ පත්කිරීම ඒ ලියවිල්ලෙහි නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකි ය:

නිසි බලධරයා පත් කිරීම

එසේ වුව ද, යම් නියෝගයක යම් කාර්යය සඳහා හෝ යම් නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා නිසි බලධරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත්කිරීම මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් වැළකේ යැයි නොසැලකිය යුතු ය.

(2) යම් නමෝදිෂ්ඨ ධුරයක් දරන්නකු නිසි බලධරයකු ලෙස පත්කරනු ලැබ ඇති අවස්ථාවක, පටහැනි විධිවිධානයක් ප්‍රකාශිතව කර ඇත්නම් මිස, එවකට එකී නමෝදිෂ්ඨ ධුරයෙහි කාර්යය ඉටුකරන තැනැත්තා වෙත ඒ පත්කිරීම දීර්ඝ වන ලෙස සැලකිය යුතුය.

6. යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාර දිය යුතු දැන්වීමක්, ඒ හදිසි අවස්ථා නියෝගයේ අඩංගු යම් විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒ තැනැත්තාට භාරදීම හෝ ඒ තැනැත්තාගේ අවසානයට දැන සිටි හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත තැපෑලෙන් යැවීමෙන් භාර දිය හැකි ය.

දැන්වීම් භාරදීම

7. යම් නියමයක් හෝ රීතියක් සෑදීම සඳහා යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරන ලද යම් බලයකට ඒ නියමය හෝ රීතිය සමාන ආකාරයෙන් සහ සමාන කොන්දේසිවලට යටත්ව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක කළහැකි බලය ද ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය.

නියමයන් ආදිය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හා වෙනස් කිරීම

## II වන කොටස

### පරිශ්‍ර හා වාහන සන්තකයට ගැනීම සහ පුද්ගල සේවාවන් අධිග්‍රහණයට ගැනීම

8.(1) යම් ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍ර යම් ස්වභාවික විපතක් සම්බන්ධයෙන් වන සහන කටයුතු සඳහා අවශ්‍යවන අවස්ථාවක, එම ප්‍රදේශයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කර්නල්වරයකු හෝ ඊට ඉහළ නිලධරයෙකු, කොමදෝරුවරයකු හෝ වින්ග් කොමාන්ඩර්වරයකු විසින් එකී කාර්යය සඳහා එම ගොඩනැගිලි හෝ පරිශ්‍රවල බුක්තිය ලබාගත යුතු අතර එහි සිටින යම් තැනැත්තකු හෝ එහි සාමාන්‍ය පදිංචිකරුවකු හෝ එම ගොඩනැගිල්ලෙන් හෝ පරිශ්‍රයෙන් පිටමං කොට යම් බලරහිත තැනැත්තන් එම ගොඩනැගිලි හෝ පරිශ්‍රවලට ප්‍රවේශවීමෙන් ආරක්ෂා කළයුතුය.

පරිශ්‍ර අධිග්‍රහණය කිරීම

එසේ වුවද, එම දේපළට අයිතිය කියාපාන යම් තැනැත්තෙකුට එම දේපළ නිදහස් කර ගැනීම සඳහා ආඥාවක් කරවා ගැනීම පිණිස, මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමේ හිමිකම තිබිය යුතුය. එම ආඥාව කිරීමෙන් සති දෙකක කාලසීමාවක් ඉකුත්වූ පසුව, එම දේපළ ඔහුගේ දැනුම නොමැතිව හෝ ඔහුගේ උපදෙස්වලට පටහැනිව හෝ පාවිච්චි කරන ලද බවට මහාධිකරණය සෑහීමකට පත්වේ නම් මහාධිකරණය විසින් එම දේපළ මුදාහරිනු ලැබිය හැකිය.

එසේම තවදුරටත්, එම දේපළ සන්තකයට ගැනීමෙන් මාස හයක් ඇතුළත ඉහත සඳහන් පරිදි වූ වරදක් සිදුකිරීම සඳහා නඩු කටයුතු කිසිවක් ආරම්භ නොකරන ලද්දේ නම් එම දේපළ එහි නීත්‍යානුකූල අයිතිකරු වෙත ආපසු භාරදෙනු ලැබීය යුතුය.

(2) යම් තැනැත්තෙකු මේ නියෝග යටතේ යම් වරදක් සඳහා වරදකරු කර ඇති අවස්ථාවක සහ එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍ර මේ නියෝගය යටතේ යම් වරදක් කිරීම සඳහා හෝ යම් වරදක් කිරීම සම්බන්ධයෙන් භාවිතා කොට ඇති බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම්, අධිකරණය විසින් එවැනි වරදක් සඳහා පණවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතරව එම දේපළ ජනරජයට අත්කර ගැනීම ද කළයුතුය.

9 (1) ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ ජනජීවිතය සඳහා අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා හෝ අවශ්‍ය හෝ අවස්ථාවෝචිත බව නිසි බලධරයාගේ මතය වන්නේ නම් ශ්‍රී ලංකාව තුළ ඇති කවර හෝ වාහනයක් ඔහු විසින් අධිග්‍රහණය කරනු ලැබිය හැකි අතර එම අධිග්‍රහණය

වාහන අධිග්‍රහණය කිරීම

සම්බන්ධව අවශ්‍ය හෝ අවස්ථාවෝචිත බව නිසි බලධරයාට පෙනී යන යම් විධාන ඔහු විසින් දෙනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ යම් වාහනයක් නිසි බලධරයා විසින් අධිග්‍රහණය කරනු ලැබූ අවස්ථාවක, ජාතික ආරක්ෂාව පිණිස හෝ මහජන සාමය සුරක්ෂිත කිරීම හෝ ජන ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම පිණිස අවශ්‍යයැයි හෝ අවස්ථාවෝචිතයැයි නිසි බලධරයා අදහස් කරන යම් කාර්යයක් සඳහා හෝ ආකාරයකට ඒ වාහනය පාවිච්චි කිරීම හෝ ඒ වාහනය සම්බන්ධයෙන් කටයුතු කිරීම *නැතහොත්* පාවිච්චිය හෝ කටයුතු කිරීම සඳහා බලයදීම කරනු ලැබිය හැකිය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදයෙන් පැවරී ඇති බලතල සාර්ථකව ක්‍රියාවේ යෙදීම පිණිස විධානයක් කිරීම අවශ්‍ය බව නිසි බලධරයකුගේ මතය වන්නේ නම්, ඔහු විසින් මුළු ශ්‍රී ලංකාව හෝ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත කොටසකට අදාළව කරන නියමයක් මගින්, ඒ නියමය බලාත්මක වන අවස්ථාවේ දී ඒ නියමයේ විස්තර කර තිබිය හැකි යම් වාහනයක් ඒ නියමය අදාළ ප්‍රාදේශයේ යම් පරිශ්‍රයක, තමා සන්තකයේ *නැතහොත්* තමාගේ පාලනය යටතේ තිබෙන කිසිම තැනැත්තකු විසින් ඒ වාහනය එම පරිශ්‍රයෙන් ඉවත්කර ගැනීමට එකී නියමයේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු විසින් හෝ බලධරයකු විසින් අවසර දෙන තාක් ඒ පරිශ්‍රයෙන් ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට සැලැස්වීම *නැතහොත්* අවසර දීම නොකළ යුතු බවට විධාන කරනු ලැබිය හැකිය.

(4) මේ නියෝගයේ මීට ඉහතින් ඇති විධිවිධාන මගින් යම් තැනැත්තකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීමෙහි ලා උපකාර කරන ලෙස සහ සහාය වන ලෙස ඒ තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, සන්නද්ධ සේවයක හෝ ආණ්ඩුවේ සේවයේ යම් නිළධරයකු විසින් එසේ උපකාර කිරීම හෝ සහාය වීම කළ යුතු ය.

පුද්ගල සේවා අධිග්‍රහණය කිරීම

10. රාජ්‍ය ආරක්ෂාව පවත්වාගෙන යාම හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ආධාර වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් යම් වැඩක් කිරීමට හෝ පුද්ගලික සේවයක් කිරීමට ස්වකීය අත්සන යටතේ ආඥාවකින් යම් තැනැත්තකුට නියම කිරීම හෝ ඒ ආකාරයෙන් නියම කිරීමට ඒ වෙනුවෙන් නියමිත බලධරයන් හෝ නිළධරයන් එක් තැනැත්තකුට හෝ ඊට වැඩි දෙනෙකුට බලය පැවරීම ජනාධිපතිවරයා විසින් කළ හැකි ය. මේ නියෝගය යටතේ සාදන ලද යම් නියමයක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා වරදකට වරදකරු වන්නේ ය.

අත්‍යශ්‍ය සේවා සම්බන්ධීකරණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පත් කිරීම

11. (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහාම අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි ය. අත්‍යාවශ්‍ය සේවා සැපයීම සහ පවත්වාගෙන යාමට අදාළ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි අතිරේක කොමසාරිස්වරයන්, නියෝජ්‍ය කොමසාරිස්වරයන් හෝ සහකාර කොමසාරිස්වරයන් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(3) අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ ඔහු වෙත පවරා ඇති හෝ නියම කොට ඇති බලතල, කාර්යය හෝ කර්තව්‍යය (2) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ යම් අතිරේක කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(4) පහත දැක්වෙන යම් බලයක්, එනම් 10 වන නියෝගය යටතේ වූ යම් බලයක් නියෝගය යටතේ පවරන ලද්දා වූ යම් බලධරයකු හෝ නිළධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්, අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝගය යටතේ වූ කාර්යය ඉටුකිරීම සඳහා ක්‍රියාවේ යොදවනු ලැබිය හැකිය.

(5) අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) මේ නියෝග යටතේ යම් බලයක් පවරා ඇත්තේ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත ද, එම බලධරයා හෝ නිලධරයා; සහ

(ආ) 48 වන නියෝගය යටතේ පත්කරන ලද යම් සම්බන්ධීකරණ නිලධරයකු,

වෙත, අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යම් විධාන ලබා දෙනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයකටම අනුකූලව කටයුතු කිරීම, අවස්ථාවෝචිත පරිදි, එකී බලධරයාගේ, නිලධරයාගේ හෝ සම්බන්ධීකරණ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

අත්‍යාවශ්‍ය සේවා

12. (1) මහජන සාමය පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සඳහා සහ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, ජනාධිපතිවරයා විසින්, *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් (1) වන ඡේදයට අනුකූලව අත්‍යාවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත්කරන ලද සේවයක් හා සම්බන්ධ යම් වැඩක යෙදී සිටින හෝ නියුක්ත කරනු ලැබ සිටින යම් තැනැත්තකු විසින් -

(අ) ඒ නියමයේ දින සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු ඔහුගේ වැඩ කරන *නැතහොත්* සේවයේ නියුක්ත ස්ථානයට හෝ ඔහුගේ සේවා යෝජකයා *නැතහොත්* ඔහුගේ සේවා යෝජකයාගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ස්ථානයට පැමිණ සිටීමට නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළ හෝ ඒ සේවයේ ඔහුගේ සේවා නියුක්ති නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව නියමිත පරිදි වැඩ කිරීම නීත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළ හොත් හෝ සාමාන්‍ය වැඩ කරන දිනයක සම්පූර්ණ වැඩ කරන කාලසීමාව හෝ ඉන් යම් කොටසක් තුළ වැඩ නොකර එසේ වැඩ කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ වැඩ කිරීමෙන් බැහැරව සිටියහොත්; හෝ

(ආ) ඒ නියමයේ දින සිට එක් දිනක් ඉකුත් වීමෙන් පසුව ඔහුගේ සේවායෝජක විසින් හෝ ඔහුගේ සේවායෝජකගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි යම් වැඩක් කිරීම, නිත්‍යානුකූල හේතුවක් නොමැතිව පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්; හෝ

(ඇ) නිශ්චිත සේවයක යොදවනු ලැබූ හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකුව සිටියදී ඔහුගේ සේවායෝජක හෝ සේවායෝජකගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් වරින් වර විධාන කරනු ලැබිය හැකි පරිදි ඒ වැඩ, ඒ සේවායෝජක හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියාකරන තැනැත්තා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි වේලාවක හෝ ස්ථානයක දි හෝ යම් කාල සීමා ඇතුළත ඉටු කිරීම ( ඒ වේලාව හෝ ස්ථානය හෝ කාලසීමාව සාමාන්‍ය වැඩ කරන වේලාව ඇතුළත හෝ ඉන් පිටස්තරව වුව ද නිවාඩු දිනවලදී වුවද ) පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්, ඔහු එසේ පැමිණ සිටීම හෝ වැඩ කිරීම පැහැර හැර හෝ ප්‍රතික්ෂේප කර ඇත්තේ වැඩ වර්ජනයක් හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාමාර්ගයක් නිසා වුව ද නොතකා ඒ තැනැත්තා -

(i) වෙනත් යම් නීතියක හෝ ඔහුගේ සේවා නියුත්තිය පාලනය වන යම් ගිවිසුමක නියමයක් හා කොන්දේසි කුමක් සඳහන් ව තිබුණ ද ඒ වහාම ඔහුගේ සේවා නියුක්තිය කෙළවර කළ ලෙස හෝ අත්හැරිය ලෙස සියළු කාර්යය සඳහා සැළකිය යුතු ය; තවද

(ii) ඊට අමතරව ඔහු වරදකට වරදකරු විය යුතු ය.

මේ ඡේදයෙහි "නිශ්චිත සේවය" යන්නෙන්, යම් සේවයක් හා සම්බන්ධව යම් වැඩක නියුක්ත කළ හෝ යොදවනු ලැබූ යම් තැනැත්තකුට, වැඩ කරන සාමාන්‍ය වේලාවෙන් බාහිරව හෝ නිවාඩු දිනවල හෝ වැඩ කරන ලෙස නියම කරනු ලැබිය හැකි අත්‍යාවශ්‍ය සේවයක් වන (1) වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් "නිශ්චිත සේවයක් " බවට ප්‍රකාශයට පත්කළ කවර හෝ අත්‍යාවශ්‍ය සේවයක් අදහස් වේ.

(3) යම් සේවයක් අත්‍යාවශ්‍ය සේවයක් බවට ජනාධිපතිවරයා විසින් *ගැසට්* පත්‍රයේ පළකරන නියමයක් මගින් ප්‍රකාශයට පත්කරනු ලැබූ අවස්ථාවක -

(අ) කවර වූ හෝ ආකාරයකින් -

(i) ඒ සේවය පවත්වාගෙන යාමට අවහිර කරන බාධා කරන, ප්‍රමාද කරන හෝ සීමා කරන;

(ii) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකු ඔහුගේ සේවා ස්ථානයට පැමිණීමට අවහිර කරන, බාධා කරන හෝ පැමිණීම වළක්වන;

(iii) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තකු ඔහුගේ සේවා ස්ථානයට පැමිණීමෙන් වැළකීමට පොළඹවන, කැමති කරවා ගන්නා, හෝ දිරිමත් කරන;

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ දෙපාර්තමේන්තුවක ශාඛාවකින් වන සේවය වෙනුවට හෝ ඊට සමාන්තරව වෙනත් යම් සේවයක් පිහිටු වීමට හෝ පවත්වාගෙන යාමට බල කරන පොළඹවන, කැමති කරවා ගන්නා හෝ ධෛර්යය දෙන;

(v) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව සේවයේ නියුක්ත කර සිටින වෙනත් යම් තැනැත්තෙකුට ඔහුගේ සේවා නියුක්තිය අත්හැරීමට හෝ ඒ සේවා නියුක්තියෙන් ඉවත්ව යාමට බල කරන. පොළඹවන කැමැති කරවා ගන්නා හෝ ධෛර්ය දෙන ( ඒ වෙනත් තැනැත්තා එසේ සේවා නියුක්තිය අත්හැරීම හෝ ඉන් ඉවත්ව යාම කරනු ලැබුව ද නොලැබූ); හෝ

(vi) ඒ සේවය පවත්වාගෙන යාම සඳහා හෝ ඒ හා සම්බන්ධව වෙනත් යම් තැනැත්තකු විසින් සේවා නියුක්තිය සැපයීම හෝ භාර ගැනීම වළක්වන

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

(4) මේ නියෝගයේ ( 2 ) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් තමාගේ සේවා නියුක්තිය කෙළවර කර හෝ එම සේවා නියුක්තිය අත්හල ලෙස සැලකෙන සෑම තැනැත්තෙකුම, ආණ්ඩුව විසින් හෝ වෙනත් සේවා නියුක්තිය කෙළවර කළ හෝ අත්හල දින සිට දින තුනක් ඇතුළත ඉවත් විය යුතු ය. එම කාල සීමාව ඇතුළත එවැනි නිල නිවාසයකින් ඉවත්ව යාම පැහැර හරින කවර හෝ තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදක් කරන්නේ ය.

මේ ඡේදයෙහි නිල නිවාසය යන්නෙන්, පදිංචිව සිටින හෝ වාසය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩ පහසුකම අදහස් වන අතර ඒ ගොඩනැගිල්ල, කාමරය හෝ වෙනත් ඉඩ පහසුකම පිහිටා තිබෙන යම් ඉඩමක් පරිශ්‍රයක් ඊට ඇතුළත් වේ.

(5) මේ නියෝගයට එරෙහිව යම් වරදක් සම්බන්ධයෙන් කවර හෝ අධිකරණයක් විසින් යම් තැනැත්තෙක් වරදකරු කරන ලද අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය නියම කරන වෙනත් යම් දණ්ඩනයකට අමතරව -

(අ) ඒ වරදකරු කිරීම ප්‍රකාර. ඒ තැනැත්තා සතු සියළු චංචල හෝ නිශ්චල දේපළ ජන රජය සතු වූ ලෙස සැලකිය යුතු ය; තව ද

(ආ) මේ නියෝග බලාත්මක වූ දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් සිදු කරන ලද දේපළ අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ශූන්‍ය හා බල රහිත ලෙස සැළකිය යුතු ය.

(6) යම් සේවයක්, ජනාධිපතිවරයා විසින් *ගැසට්* පත්‍රයේ පළකරන නියමයක් මගින් අත්‍යාවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබූ අවස්ථාවක අවශ්‍යයයි සැළකෙන කල්හි, එසේ අත්‍යාවශ්‍ය බවට ප්‍රකාශයට පත්කරන ලද එවැනි යම් සේවයක සේවයේ නියුක්ත කර සිටින හෝ ඒ යම් සේවයකට අයත් යම් නිලධරයකුගේ, සේවකයකුගේ, සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයෙකුගේ සේවය, අදාළ විෂයය පවරා දෙනු ලැබ සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා, ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් අධිග්‍රහණය කරනු ලැබිය හැකිය.

සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා පත්කිරීම

13. (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහා සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයෙකු ලෙස ධුරය දැරීම සඳහා යම් තැනැත්තෙකු නමින් නිලයෙන් පත්කළ හැකිය.

(2) මේ නියෝග යටතේ තමාගේ කාර්යය ඉටු කිරීමේ දී සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයාට සහාය වීම පිණිස, යම් නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන් හෝ නිසි බලධරයන් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකිය.

(3) මේ නියෝග මගින් හෝ යටතේ සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා වෙත පැවරී හෝ නියම වී තිබෙන යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් (2) වන ඡේදය යටතේ පත්කරනු ලබන යම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුට, සහකාර කොමසාරිස්වරයෙකුට හෝ නිසි බලධරයකුට, කොමසාරිස්වරයා විසින් පවරනු ලැබිය හැකිය.

(4) යම් බලධරයකු වෙත පැවරී තිබෙන හෝ මේ නියෝග යටතේ යම් නිලධරයකු වෙත පවරාදී තිබෙත. මේ නියෝගය යටතේ වූ යම් බලයක්, මේ නියෝග යටතේ කාර්යය ඉටු කිරිම පිණිස සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා විසින් ක්‍රියාවේ යොදනු ලැබිය හැකිය.

(5) සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා විසින් -

(අ) 10 වන නියෝගය යටතේ යම් බලයක් පවරා දී තිබෙන යම් බලධරයකුට හෝ නිලධරයකට ; සහ

(ආ) 48 වන නියෝගය යටතේ පත් කරන ලද සම්බන්ධීකරණ නිලධරයකුට

සිවිල් ආරක්ෂාව පවත්වාගෙන යන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි විධාන දෙනු ලැබිය හැකි අතර, ඒ සෑම විධානයක් අනුවම කටයුතු කිරීම ඒ නිසි බලධරයාගේ කාර්යය වියයුතුය.

උපදේශක කමිටුව

14. සෑම ප්‍රාදේශීය ලේකම්වරයකුම, පිළිවෙලින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා, සහ ප්‍රජාව අතර පිළිගැනීමක් ඇති වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත්කරනු ලැබිය යුතු ය. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත මහජන සාමය සුරක්ෂිත කිරීම සහ අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙනයාම පිළිබඳව අදාළ බලධරයකුට උපදෙස් දීම ඒ සෑම කමිටුවකම කාර්යය විය යුතු ය.

## III වන කොටස

### ඇතුළුවීමේ අයිතිවාසිකම් යනාදිය

අනවසර ඇතුළුවීම වැළැක්වීම

15. (1) අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙනයාම පිණිස සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් වුවමනා හෝ ප්‍රයෝජනයට ගනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ පරිශ්‍රයකට අනවසර තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ පූරාරක්ෂා යෙදිය යුතු බව නිසි බලධරයකුගේ මතය වන්නේ නම්, ඒ බලධරයා විසින් නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චයකොට දැක්වෙන නියමයේ නිශ්චිතව සඳහන් කරන තැනැත්තකුගේ හෝ අවසරය නොමැතිව, කිසි තැනැත්තකු එම ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ පරිශ්‍ර වලට ඇතුළු නොවිය යුතු බවට හෝ එහි රැඳී නොසිටිය යුතු බවට විධිවිධාන සැළැස්විය හැකිය.

(2) මේ නියෝගය යටතේ කරන ලද නියමයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු ඒ යම් ප්‍රදේශයක ස්ථානයක හෝ පරිශ්‍රයක සිටියහොත්, ඔහුට විරුද්ධව පවත්වනු ලබන යම් නීති කෘත්‍යයකට අගතියක් නොමැතිව යම් පොලිස් නිලධරයකු, හෝ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සාමාජිකයකු, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින් හෝ නිසි බලධරයකු විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය හැකිය.

(3) මේ නියෝගයෙහි "නිසි බලධරයා" යන්න යම් අත්‍යවශ්‍ය සේවයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සේවයේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් නිසි බලධරයකු ලෙස නමින් හෝ නිලයෙන් පත්කරන ලද යම් තැනැත්තෙක් ඉන් අදහස් වේ.

## IV වන කොටස

### *සෝදිසි කිරීම සහ වරද සඳහා සිරභාරයට ගැනීම*

වැරදි සඳහා සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීම

16. (1) යම් පොලිස් නිලධරයකු හෝ ශ්‍රී ලංකා යුද හමුදාවේ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු හෝ මේ නියෝගය යටතේ ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකු හෝ විසින් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 354, 355 356, 357, 358, 359, 360, 360 අ, 360 ආ සහ 360 ඇ වන වගන්ති සහ 364. 365, 365 අ සහ 465 ආ සහ 427 සිට 446 වන වගන්තිය දක්වා වන වරදක් කරන්නා වූ හෝ කරනු ලැබ *නැතහොත්* වරදක් හා සම්බන්ධ හෝ වරදක් කරන ලෙස හෝ කරනු ලැබූ ලෙස සැක කරනු ලැබීමට යුක්තිසහගත හේතු ඇත්තා වූ තැනැත්තකු සෝදිසි කිරීම එම සෝදිසි කිරීමේ කාර්ය සඳහා රඳවා තබා ගැනීම, හෝ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම කළ හැකිය. තව ද වරද සිදු කිරීමේ දී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කවර ආකාරයේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිසි කිරීම තහනමට ගැනීම, ඉවත් කිරීම හා රඳවා තබා ගැනීම කළ හැකිය.

360 ඇ වන වගන්ති සහ 364. 365, 365 අ සහ 465 ආ සහ 427 සිට 446 වන වගන්තිය දක්වා වන වරදක් කරන්නා වූ හෝ කරනු ලැබ *නැතහොත්* වරදක් හා සම්බන්ධ හෝ වරදක් කරන ලෙස හෝ කරනු ලැබූ ලෙස සැක කරනු ලැබීමට යුක්තිසහගත හේතු ඇත්තා වූ තැනැත්තකු සෝදිසි කිරීම එම සෝදිසි කිරීමේ කාර්ය සඳහා රඳවා තබා ගැනීම, හෝ වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගැනීම කළ හැකිය. තව ද වරද සිදු කිරීමේ දී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කවර ආකාරයේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිසි කිරීම තහනමට ගැනීම, ඉවත් කිරීම හා රඳවා තබා ගැනීම කළ හැකිය.

(2) (1) වන ඡේදය යටතේ රදවා තබා ගනු ලැබූ හෝ සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් අත්අඩංගුවට ගනු ලැබූ යම් තැනැත්තකු පැය විසිහතරක් ඇතුළත ආසන්නතම පොලිස් ස්ථානය වෙත භාර දෙනු ලැබිය යුතුය.

(3) සෝදිසි කරනු ලැබූ ස්ථානයෙහි, භූමියෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටි අන් කිසි තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්යය හා සම්බන්ධ හෝ එයට අදාළ වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තකු විසින් ප්‍රශ්න කළ හැකිය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ සෑම තැනැත්තෙකුම විසින් ප්‍රශ්න කරනු ලැබූ කාරණය සම්බන්ධයෙන් තමා දන්නා යම් තොරතුරක් සැපයිය යුතුය.

(5) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් පරිශ්‍රයක, ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පදිංචිව සිටින හෝ එවැනි පරිශ්‍රයක් ස්ථානයක්, වාහනයක් හෝ යාත්‍රාවක් භාරව සිටින තැනැත්තකු විසින්, සෝදිසි පවත්වනු ලබන තැනැත්තාගේ ඉල්ලීම අනුව අවහිර නොමැතිව එම පරිශ්‍රයට, ස්ථානයට, වාහනයට හෝ යාත්‍රාවට ඔහුට ඇතුළු වීමට ඉඩ හැරීම හා එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්ති සහගත පහසුකම් ඔහුට සැළසීම ද කළ යුතුය.

(6) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත්වනු ලබන තැනැත්තා විසින් සෝදිසි කළයුතු පරිශ්‍රයට, ස්ථානයට, වාහනයට හෝ ඒ යාත්‍රාවට ඇතුළු වීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කළ හැකිය. *නැතහොත්* කඩා විවෘත කළ හැකිය.

(7) ස්ත්‍රියක සෝදිසි කිරීමට සැලැස්වීම අවශ්‍ය වන අවස්ථාවක එම සෝදිසිය වෙනත් ස්ත්‍රියක විසින් කළ යුතුය.

(8) (1) වන ජේදය යටතේ කරන ලද සිරභාරයට ගැනීම පිළිබඳව, සිරභාරයට ගැනීමේ නිලධරයා පොලිස් නිලධරයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරන ලද කොට්ඨාසයේ පොලිස් අධිකාරිවරයා වෙත ද, සිරභාරයට ගැනිමේ නිලධරයා සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරන ලද ප්‍රදේශයේ අණදෙන නිලධරයා වෙත ද, එසේ සිරභාරයට ගැනීමෙන් පැය විසි හතරක් ඇතුළත වාර්තා කිරීම සිරභාරයට ගැනීමේ නිලධරයාගේ කාර්යය විය යුතුය.

(9) මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් දේපළක් ලබා ගන්නා හෝ රඳවා තබා ගන්නා අවස්ථාවක ලබාගැනීම හෝ රඳවා තබා ගැනීම බලාත්මක කරනු ලබන තැනැත්තා විසින් එම දේපළ තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබුවේ යම් තැනැත්තකුගේ භාරයෙන් ද එම තැනැත්තාට ඒ දේපළ සම්බන්ධයෙන් ලදු පතක් නිකුත් කරනු ලැබිය යුතුය.

## V වන කොටස

### වැරදි හා දණ්ඩන

වැරදි

17. (1) (අ) චංචල හෝ නිශ්චල දේපළකට විනාශයක් හෝ හානියක් සිදුකරන හෝ එවැනි යම් දේපළක වටිනාකම නැති කරන හෝ ප්‍රයෝජනය අඩු කරන හෝ ප්‍රයෝජනය අඩු කරන අන්දමේ යම් වෙනසක් ඇති කරන යම් ක්‍රියාවක් කරන හෝ -

(ආ) ගින්නෙන් හෝ යම් දාහක ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන හෝ විබාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමා ගසන ආයුධයකින් හෝ යම් අන්දමක උපකරණයකින් වෙනත් තැනැත්තෙකුට මරණය හෝ තුවාල සිදුකරන හෝ එබන්දක් කිරීමට තැත් කරන හෝ ;

(ඇ) දණ්ඩ නීති සංග්‍රහයේ 354, 355, 356, 357. 358, 359, 360, 360 අ, 360 ආ සහ 360 ඇ වන වගන්ති යටතේ කවර වූ හෝ ආකාරයට වරදක් සිදු කරන;

(ඇ) පදිංචිය හිස් කොට තිබෙන හෝ අනාරක්ෂිතව ඇති හෝ අලාභ හානි සිදුකොට ඇති හෝ විනාශයට පත් කොට ඇති යම් ස්ථානයකින් යම් ද්‍රව්‍යයක් සොරකම් කරන හෝ ;

(ඉ) දණ්ඩ නීති සංග්‍රහයේ 427 සිට 446 වන වගන්තිවලින් කවර හෝ වගන්තියක් යටතේ යම් වරදක් සිදු කරන හෝ යම් ස්ථානයකින් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍යය නීති විරෝධී ලෙස ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන හෝ;

(ඊ) දණ්ඩ නීති සංග්‍රහයේ 364, 365. 365 අ සහ 365 ආ වන වගන්තිවලින් කවර හෝ වගන්තියක් යටතේ යම් වරදක් සිදුකරන හෝ එවැනි යම් පරිශ්‍රයකින් නීති විරෝධි ලෙස යම් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍යය ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන හෝ;

(උ) (ඇ) හෝ (ඉ) අනුජේදයේ යම් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍යය සම්බන්ධයෙන් (ඇ) හෝ (ඉ) අනුජේදයේ යටතේ වරදක් සිදුකරනු ලැබූ බව දැනම හෝ විශ්වාස කිරීමට හේතු ඇතිව ඒ අනුජේදවල සඳහන් යම් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍යය වංචනික ලෙස බාරගන්නා හෝ තබා ගන්නා,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය. තවද දණ්ඩ නීති සංග්‍රහයේ හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුව ද මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට මරණ දඬුවමට හෝ ජීවිතාන්තය දක්වා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.

(2) දේපළ පුද්ගලිකව ආරක්ෂා කිරීම පිළිබඳව අයිතිවාසිකමට අදාළ වන්නා වූ ද ඒ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදීමේ දි වරද කරන්නකුට මරණය හෝ වෙනත් හානියක් සිදුකරවනු ලැබිය හැකි අවස්ථා නියම කරන්නා වූද, දණ්ඩ නීති සංග්‍රහයේ 96 වන වගන්තිය. ඒ වගන්තිය අවසානයේදී පහත දැක්වෙන පාඨය එකතු කරනු ලැබූ සේ බල පැවැත්විය යුතු ය.

"පස්වනුව - හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගයන්හි 22 වන නියෝගය යටතේ යම් වරදක්"

(3) (අ) වරද කරන වේලාවෙහි හෝ ඒ අවස්ථාවෙහි පැවති මහජන කැළඹීම වර්ධනය කිරිම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ මහජන කැළඹීමක දී වරද කරනු ලැබූ බවට නීතිපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්. ඒ වරද සම්බන්ධයෙන් හදිසි අවස්ථා නියෝග යටතේ අධිචෝදනාවක් නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

එසේ වුව ද, යම් වරදක් කිරීමට අදාළ අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව නීතිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වරද හෝ වැරදි වර්ග සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරිමට ඔහු විසින් පොලිස් පතිවරයාට බලය පවරනු ලැබිය හැකිය. ඉන් අනතුරුව එම කටයුතු පොලිස්පතිවරයාගේ ලියවිල්ලක් වූ අවසරය අතැතිව ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(ආ) මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, මේ නියෝගවල 29 වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති දඬුවමින් එම වරද සඳහා දඬුවම් කරනු ලැබිය යුතුය.

18. කිසිම තැනැත්තකු විසින් - අප්‍රසාදය වැළැක්වීම

(අ) (i) රජයේ නිලධරයන් වූ,

(ii) ජන රජයේ සේවයෙහි නියුක්ත, හෝ

(iii) අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීමෙහි නියුක්ත වූ තැනැත්තන් අතර අප්‍රසාදය ඇති කිරීමට උත්සාහ කිරීම

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු රජයේ නිලධරයෙකු වශයෙන් හෝ අවස්ථාවෝචිත පරිදි එලෙස නියුක්ත වූ තැනැත්තකු වශයෙන් හෝ තම යුතුකම කඩ කරනු වස් යමක් කිරීමට හෝ යමක් නොකොට පැහැර හැරීමට හෝ පෙළඹ වීමට උත්සාහ කිරීම;

(ඇ) (අ) අනුජේදය හෝ (ආ) අනුජේදය උල්ලංඝනය කිරීමේ අදහසින් හෝ උල්ලංඝනය කිරීමට සහය වීම, අනුබල දීම *නැතහොත්* උපදෙස් දීම සඳහා හෝ ඉහත කී තැනැත්තන් අතර පිටපත් විසුරුවා

හැරීමෙන් එබඳු උල්ලංඝනය කිරීමක් සංඝෘහිත වන ස්වභාවයකින් යුත් යම් ලේඛනයක් තම සන්තකයේ හෝ තම පාලනය යටතේ තබා ගැනීම නොකළ යුතු ය.

පත්‍රිකා ආදිය බෙදා හැරීම

19. මහජන ආරක්ෂාවට මහජන සාමයට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාමට අගතිදායක වන කාරණා අඩංගු යම් දැන්වීම් කොළ, අත්පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයකට ඇලවීම හෝ මහජනයා අතර බෙදාහැරීම හෝ කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

කටකතා හෝ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම

20. මහජනයා බිය ගැන්විය හැකි හෝ මහජනයා කැළඹිය හැකි ආකාරයේ කිසිම කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් කට වචනයෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ස්වයංක්‍රීය පද්ධති හෝ කෘතිම බුද්ධිය ඇතුළු ස්වයංක්‍රීය පද්ධති හෝ යම් ලිඛිත, විද්‍යුත්, ඩිජිටල් හෝ වෙනත් යම් ආකාරයක මාධ්‍යක් හරහා සන්නිවේදනය කිරීම, පළකිරීම, නිර්මාණය කිරීම හෝ පැතිරවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

අසත්‍ය ප්‍රකාශ

21. යම් තැනැත්තකු -

(අ) යම් හදිසි අවස්ථා නියෝගය ප්‍රකාර හෝ එවැනි යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ප්‍රකාර හෝ කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැළකිය යුතු කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් තමාට ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළ හොත් හෝ එවැනි යම් තොරතුරක් සැපයුවහොත්, *නැතහොත්.*

(ආ) ඔහු විසින් පිළියෙළ කළ යුතු යයි යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ ආඥාවකින් හෝ නියම කරනු ලැබූ යම් ගිණුමක ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ වෙනත් යම් ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කළහොත්.

එම තැනැත්තා වරදකට වරදකරු විය යුතුය.

හානිවන ආකාරයේ ද්‍රව්‍ය විසිකිරීම

22. රථයක්. මැදිරියක්. ට්‍රක් රථයක්, හෝ වාහනයක් තුළ හෝ මත සිටින යම් තැනැත්තකුගේ ආරක්ෂාවට හානි වන පරිදි යම් දුම්රිය මාර්ගයක ඒ තැනැත්තාට හෝ ඒ ඇන්ජිමකට ඈඳූ රථයකට, මැදිරියකට හෝ ට්‍රක් රථයකට හෝ යම් ප්‍රසිද්ධ පාරක යම් වාහනයකට, කිසිම තැනැත්තකු විසින් කිසිම දෙයක් හෝ ද්‍රව්‍යයක් විසි නොකළ යුතු ය. මේ නියෝගයේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයකට අඩු නොවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

බිය ගැන්වීම වැළැක්වීම

23. (1) කිසිම තැනැත්තකු, වෙනත් යම් තැනැත්තකු වාසය කරන, වැඩකරන හෝ ව්‍යාපාර කටයුතු ගෙන යන හෝ සිටින යම් නිවසක් හෝ ස්ථානයක් ආසන්නයට හෝ නිවසකට හෝ ස්ථානයකට එම නිවසේ හෝ ස්ථානයේ යම් තැනැත්තකු භය ගන්වන ආකාරයෙන් හෝ ඒ ගෙයට හෝ ස්ථානයට ඇතුළු වීම හෝ ඉන් පිටවීම අවහිර කරන ආකාරයෙන් හෝ සාමය කඩවීමට තුඩු දෙන ආකාරයෙන් හෝ ඒ ගෙයට *නැතහොත්* ස්ථානයට හෝ ඒ අසළට කිසිදු තැනැත්තකු නොයා යුතුය.

(2) මේ නියෝගයෙහි ''භය ගැන්වීම'' යෙදුමෙන් යම් තැනැත්තකුට, හෝ සිය පවුලේ යම් සාමාජිකයකුට හෝ තමාගෙන් යැපෙන යම් තැනැත්තකුට හෝ හානියක් සිදුවේ යැයි *නැතහොත්* යම් තැනැත්තකුට හෝ දේපළකට සාහසික ක්‍රියාවක් හෝ අලාභයක් සිදුවේ යැයි යුක්ති සහගත හැඟීමක් යම් තැනැත්තකුගේ සිතේ ජනිත කරවීම අදහස් වන අතර, ''හානිය'' යන යෙදුමට යම් තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තීය, සේවා නියුක්තිය හෝ වෙනත් ආදායම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට සිදුවන යම් හානියක් ඇතුළත් වන අතර, නඩු පැවරිය හැකි යම් සිවිල් වරදක් ද ඊට ඇතුළත් වේ.

බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හෝ අවහිර කිරීම

24. කිසිම තැනැත්තකු, යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ ඒ යටතේ යම් තැනැත්තකු පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලතල හෝ කාර්යය ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතුය.

පොදු මාර්ග දුම්රිය මාර්ග ආදියට බාධා කිරීම හෝ හානි කිරීම

25. කිසිම තැනැත්තකු නීත්‍යානුකූල බලයක් නොමැතිව පොදු මාර්ගයකට පාලමකට හෝ බෝක්කුවකට හෝ යම් දුම්රිය මාර්ගයකට හෝ වාහන ප්‍රවාහනය අවහිර කිරීම හෝ ඒවාට හානි කිරීම නොකළ යුතුය.

වැරදි කිරීමට තැත් කිරීම

26. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කිරීමට -

(අ) තැත් කරන හෝ කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් කරන. හෝ

(ආ) අන් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන හෝ

(ඇ) අන් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු අතර, ඒ අනුව ඒ වරද සඳහා හදිසි අවස්ථා නියෝග යටතේ නියම කර ඇති ආකාරයට නඩු විභාගයකට ඔහු භාජනය කර හදිසි අවස්ථා නියෝග යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම ඔහුට දඬුවම් කළ යුතු ය.

වරදකට සහාය දීම

27. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ ඒ බව විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති කිසිම තැනැත්තකු විසින් එකී වරද සඳහා ඉහත කී තැනැත්තා අල්ලා ගැනීමට, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත්වීමේ අදහසින් ඒ තැනැත්තාට කිසිම සහායක් නොදිය යුතුය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

28. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම ; සහ

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම,

එම වරද තමාගේ දැනුම නොමැතිව සිදුකර ඇති බව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීමට තමා සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැළකිය යුතුය.

දණ්ඩන

29. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතේ සාදනු ලැබූ යම් නියමයක් හෝ යම් රීතියක් හෝ එවැනි නියෝගයක් යටතේ දෙනු ලැබූ විධානයක් හෝ පනවනු ලැබූ යම් නියමයක් හෝ යම් තැනැත්තකු විසින් උල්ලංඝණය කරතහොත් හෝ එවැන්නකට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය. එසේ වුව ද, මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන *නැතහොත්* මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත්ව, මාස තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ද යටත් විය යුතුය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වූ වරදක් සඳහා ඒ නියෝගයෙහි දඬුවම් නියම කර නොමැති අවස්ථාවක. ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මේ නියෝගයෙහි (1) වන ඡේදයේ නියම කරනු ලැබූ දඬුවමකට ඔහු යටත් විය යුතුය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදකරු වූ යම් තැනැත්තකුට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 (2) වන වගන්තිය අදාළ නොවිය යුතුය.

## VI වන කොටස

### විමර්ශන, නඩු විභාග යනාදිය

තොරතුරු හෙළිදරව් කිරීමේ කාර්යය

30. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් කිරීමේ චේතනාවක්, ප්‍රයත්නයක් හෝ සූදානමක් ගැන හෝ එවැනි වරදක් සිදු කිරීම පිළිබඳව හෝ දැනගන්නා කවරෙකු වුව ද ඒ පිළිබඳ තොරතුරු ආසන්නතම ග්‍රාම නිලධරයන්ට හෝ ආසන්නතම පොලිස් ස්ථානය භාරව සිටින නිලධරයාට වහාම දැන්විය යුතු ය.

(2) (1) ඡේදයේ සඳහන් තොරතුරු දැන්වීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය.

(3) හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධ යම් තොරතුරක් ලැබුණු යම් ග්‍රාම නිලධාරියකු විසින් ඒ තොරතුරු වහාම ආසන්නතම පොලිස් ස්ථානයට දැන්විය යුතු ය.

විමර්ශනය කරන පොලිස් නිලධරයන් සතු බලතල

31. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විමර්ශනය කරන යම් පොලිස් නිලධරයකු විසින් -

(අ) වරද සම්බන්ධ කරුණු අවස්ථාගත සිද්ධීන් පිළිබඳ යම් තැනැත්තකුගෙන් වාචික ප්‍රශ්න අසා එසේ ප්‍රශ්න කරන ලද තැනැත්තා කරනු ලැබූ යම් ප්‍රකාශයක් ලියා ගත හැකිය:

එසේ වුව ද, එවැනි ප්‍රකාශයක් ලියවිල්ලක් බවට පත්කරනු ලැබූ පසු එම ප්‍රකාශය කරන තැනැත්තා විසින් මෙන්ම, එය සටහන් කරන පොලිස් නිලධරයා විසින් එම ප්‍රකාශයට අත්සන් කළ යුතුය.:

එසේ ම තවදුරටත්, යන දෙපාර්ශවය ම ප්‍රකාශයට අත්සන් තැබීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීම පොලිස් නිලධරයා විසින් සටහන් කරගත යුතුය.;

(ආ) ඒ තැනැත්තාගේ ආදර්ශ අත් අකුරු, ඡායාරූප, ඇඟිලි සටහන් සහ වෙනත් හඳුනා ගැනීමේ ලක්ෂණ ලබා ගත යුතුය;

(ඇ) ඒ තැනැත්තා සෝදිසි කළ හැකි ය. : *නැතහොත්* ඒ තැනැත්තා වාසය කරන නිවස හෝ වැඩ කරන ස්ථානයට ඇතුළු වී ඒ නිවස හෝ ස්ථානය සෝදිසි කළ හැකි ය;

(ඈ) ඒබඳු යම් වරදකට අදාළ හෝ සම්බන්ධ වූ *නැතහොත්* අදාළ යයි හෝ සම්බන්ධ යයි සැක කෙරෙන යම් ස්ථානයකට, ගොඩනැගිල්ලකට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළුවී එය සෝදිසි කළ හැකිය;

(ඉ) යම් විදුලි පණිවුඩයක්, තැපැල් ලේඛනයක් හෝ යම් බැංකුවක ඇති වෙනත් පොතක් හෝ ලේඛනයක් ඇතුළුව. කවරාකාරයක වූ හෝ යම් චංචල දේපළක් පරීක්ෂා කොට තම සන්තයකට ගත හැකිය:

එසේ වුව ද, යම් බැංකුවකින් හෝ තැපැල් කාර්යාලකින් යම් පොතක් හෝ ලේඛනයක් ලබා ගැනීමට බලාපොරොත්තු වීමට පෙර, තනතුරින් සහකාර පොලිස් අධිකාරී කෙනෙකුට වඩා පහත් නොවූ පොලිස් නිලධරයකු විසින් ඒ පොත හෝ ලේඛනය විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය ව, අවස්ථාවෝචිත පරිදි ඒ බැංකුව හෝ තැපැල් කාර්යාලය භාරව සිටින කළමනාකරු හෝ නිලධරයා වෙත කලින් ලියා දැන්විය යුතුය.

සැකකරනු ලබන තැනැත්තන් සන්තකයෙහි තිබෙන ලේඛන

32. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් වරදකට සම්බන්ධ යයි සැක කෙරෙන තැනැත්තෙකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබී සොයාගනු ලබන යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රිකාවක් ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කෙරෙන යම් නීති කෘත්‍ය වලදී අදාළ විය යුතු අතර ඒ පොතේ, ලේඛනයේ හෝ පත්‍රිකාවේ අඩංගු කරුණු ඔප්පු කිරීමක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය.

ප්‍රශ්න කිරීමෙ අයිතිය හා සහාය දීමෙ කාර්යය

33. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳ විමර්ශනය කරන, හදිසි අවස්ථා නියෝග යටතේ විධිමත් ලෙස බලය පවරනු ලැබූ පොලිස් නිලධරයකු හෝ තැනැත්තකු, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇති ද-

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගනු ලැබ සිටින හෝ අත්අඩංගුවේ තබා ගනු ලැබ සිටින තැනැත්තකු ඇතුළු යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ සහ එසේ ප්‍රශ්න කරන කාලය තුළ දී එම විමර්ශනයේ කාර්යය සඳහා ඒ තැනැත්තා ස්ථානයෙන් ස්ථානයට ගෙන යෑමේ අයිතිවාසිකම් තිබිය යුතුය: තවද,

(ආ) ඒ විමර්ශනයේ කාර්යය සඳහා අවශ්‍ය වන ලිපි ලේඛන ඇතුළුව යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක්, එසේ ප්‍රශ්න කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයෙන් තමාගේ භාරයට ගැනීමේ අයිතිවාසිකම තිබිය යුතුය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකුට හෝ නිසි බලය ලැබූ වෙනත් තැනැත්තකුට සෑම සහයෝගයක්ම දීම සෑම තැනැත්තකුගේ ම යුතුකම විය යුතුය.

: (1) වන ජේදයේ (2) අනුජේදය යටතේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකු ම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්නවලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත් ද, යම් ලේඛනයක අඩංගු කරුණු ඇතුළුව විමර්ශනයට විෂයය වූ කරුණට අදාළ සියලු තොරතුරු අනාවරණය කළ යුතු ය. එම තොරතුරු හෝ එම ලේඛනවල අඩංගු කරුණු පිළිබඳ දැනීම එම තැනැත්තාට ලැබී ඇත්තේ ඔහු දරන කවර තත්ත්වයක් නිසා වුව ද එය නොසැළකිය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ හෝ සන්තකයේ ඇති ලිපිලේඛනයක් ඇතුළු යම් භාණ්ඩයක් හෝ වෙනත් යම් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකු වෙත හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත හෝ භාර දෙන ලෙස, ඒ පොලිස් නිලධරයා හෝ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් විධාන කරනු ලැබූ කල්හි එසේ භාර දීම එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුගේ ම යුතුකම විය යුතු ය.

(4) මේ නියෝගයේ විධිවිධානවලින් යමක් උල්ලඝණය කිරීම හෝ ඒ යටතේ නියම කරන ලද යම් යුතුකමක් කඩ කිරීම මේ නියෝගවල 29 වන නියෝගය යටතේ දඬුවම් පැමිණවිය හැකි හදිසි අවස්ථා නියෝග යටතේ වූ වරදක් විය යුතු ය.

34. යම් තැනැත්තකු රඳවා ගෙන හෝ අත්අඩංගුවේ තබාගෙන ඇති කාලසීමාව තුළ විමර්ශනයේ කාර්යය සඳහා සාධාරණ කාලවේලාවන් හි දී එකී යම් තැනැත්තකු වෙත යාමේ අයිතිය යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳ විමර්ශනය කරන පොලිස් නිලධරයකු සතුව තිබිය යුතු ය. ප්‍රවෙශවීමේ අයිතිවාසිකම පොලිස් නිලධරයකු සතු බව

35. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකු සතු බලතල, වෙනත් යම් ලිඛිත නිතියක් යටතේ ඔහු සතු බලතලවලට අතිරේකව මිස, ඒ බලතල හීන කිරීමක් නොවිය යුතු ය. වෙනත් බලතලවලට අතිරේකව පොලිස් නිලධරයන්ගේ බලතල

36. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල පිළිවෙලින් ශ්‍රී ලංකා යුධ හමුදාධිපති, ශ්‍රී ලංකා නාවික හමුදාධිපති හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාධිපති විසින් එම බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් අධිකාරලත් හෝ අධිකාර නොලත් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. පොලිස් නිලධරයන්ගේ බලතල වෙනත් ඇතැම් නිලධරයන් සහ තැනැත්තන් විසින් පාවිච්චි කරනු ලැබිය හැකි බව

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල ජනාධිපතිවරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ද ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

37. හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තෙකු විසින් කරනු ලැබුවේ යැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයක් ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතුය. අධිකරණයේ නීති කෘත්‍යය සඳහා ප්‍රමුඛත්වය

38. (1) මෙහි ලා අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර සහ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇති ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳ නඩු කටයුතු තත්කාලයේ ඒ තැනැත්තා සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ නිසි අධිකරණය ඉදිරියෙහි ආරම්භ කළ හැකිය. පරීක්ෂණ සහ නඩු විභාග

(2) (අ) හදිසි අවස්ථා නියෝග යටතේ පුද්ගලයන් විසින් කර ඇතැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) ඒ නියෝග යටතේ, කෙළින් ම හෝ අනියම් ලෙසින් යම් බලයක් පාවිච්චි කිරීම හෝ යුතුකමක් ඉටු කිරීම *නැතහොත්* කල්පිත පාවිච්චි කිරීම හෝ කල්පිත ඉටු කිරීම හෝ හේතුකොට ගෙන හෝ එයින් උද්ගත වූ *නැතහොත්* ඒ පාවිච්චි කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවලින් වෙන යම් ලිඛිත නීතියක් යටතේ යම් වැරදි සංයුක්ත වේ ද යම් තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන එවැනි වැරදි පිළිබඳ පරීක්ෂණ කවර අධිකරණයක දී පවත්වා නඩු විභාග කළ යුතු දැයි නීතිපතිවරයා විසින් තීරණය කළ හැකි ය. ඒ අධිකරණය ස්වකීය ප්‍රාදේශීය බල සීමාව ඇතුළත දී ඒ වරදවල් කරනු ලැබුයේ නම්, ඒ වරදවල් පිළිබඳ පරීක්ෂණ පවත්වා නඩු විභාග කළ හැකිව තිබූ අධිකරණයක් විය යුතු ය.

(3) යටත් පරිසෙයින් එක් චෝදනාවක් හෝ දෙවන ඡේදයේ (ආ) උපඡේදයේ සඳහන් වැරදිවලින් යම් වරදක් සම්බන්ධයෙන් වන විට නීතිපතිවරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියක කවර විධිවිධානයක් තිබුන ද මහාධිකරණය වෙත කෙලින්ම අධි චෝදනාවක් යොමු කළ හැකි අතර එසේ යොමු කරන ලද අධි චෝදනාව මත ජූරියක් නොමැතිව චූදිතයාට එරෙහිව නඩු විභාග කළ හැකිය.

(4) මේ නියෝගයේ ( 2 ) වන ඡේදය යටතේ යම් වරදක් ගැන පරීක්ෂණ පැවැත්වීම හෝ නඩු විභාග කිරීම කළ යුත්තේ කුමන අධිකරණයක් මගින් දැයි නීතිපතිවරයා තීරණය කරන අවස්ථාවක. ඒ වරද ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු අධිකරණය ලෙස ඔහු විසින් තම ලිඛිත නියෝගයක් මගින් ඒ අධිකරණය නම් කළ යුතු අතර, ඒ අනුව අධිකරණය විසින් ඒ නියෝගයේ බලය ප්‍රකාර පරීක්ෂණ හෝ නඩු විභාගය පවත්වා ඒ නියෝගය ඒ පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ නඩු කටයුතු වාර්තා සමග ගොනු කොට තැබිය යුතු ය.

(5) මේ නියෝගයේ ( 2 ) වන ඡේදය යටතේ නීතිපතිවරයා විසින් කරනු ලබන තීරණයක් -

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන වැරදිවලට; හෝ

(ආ) යම් විශේෂ පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන සියලු වැරදිවලට; හෝ

(ඇ) තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් සියලු වැරදිවලට ; හෝ

(ඈ) යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් විසින් හෝ යම් විශේෂ තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලේ ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශය කර ඇතැයි කියනු ලබන යම් විශේෂ පන්තියකට හෝ වර්ගයකට අයත් සියලු වැරදිවලට; හෝ

(ඉ) යම් විශේෂ තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් විශේෂ වරදක්

අදාළ කළ හැකිය.

(6) මෙම නියෝගය බල පවත්වන කාලය තුළ යම් සාපරාධ වරදක් පිළිබඳ යම් විභාගයක් හෝ නඩු විභාගයක් යම් අධිකරණයක හෝ ස්ථානයක සිට වෙනයම් අධිකරණයකට හෝ ස්ථානයකට මාරු කිරීමට නීතිපතිවරයාට බලය පවරන 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 47 වන වගන්තිය, එම වගන්තියේ (2) වන උපවගන්තිය බලාත්මක නොවූ සේ ක්‍රියාත්මක විය යුතු ය.

නීතිපතිවරයාගේ අවසරය

39. (1) 17 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව වරදක් සඳහා; හෝ

(ආ) ඒ නියෝගය යටතේ යම් බලයක් හෝ කාර්යයක් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත හෝ *නැතහොත්* ඇති වූ හෝ වරදකින් සංගෘහිත වන ක්‍රියාව හෝ නොකර හැරීම වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන වරදක් සඳහා,

කිසිම නඩු පැවරීමක් නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලබන අනුමතය මගින් හෝ ඒ අනුමතය මත හෝ නොකළ යුතු ය.

(2) කරනු ලැබූ යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතු යයි ප්‍රකාශ කරමින් ජනාධිපතිවරයා විසින් නියමයක් කළ හැකිය. තව ද නියමය බලපවත්වනතාක් එවැනි වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතු ය.

මහාධිකරණ ඉදිරියේ නඩු විභාගය

40. (1) යම් හදිසි අවස්ථා නියෝගයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද , හදිසි අවස්ථා නියෝග යටතේ යම් වරදක් සම්බන්ධයෙන් විශේෂ අධිකරණ විභාගයක් ඇතුළුව නඩු විභාගය, නීතිපතිවරයා

විසින් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබීම මත, පවත්වනු ලැබිය හැකි අතර, එවිට චෝදනාවකට ලක් වූ තැනැත්තාට විරුද්ධව, අවස්ථාවෝචිත පරදි ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ මූලික පරීක්ෂණයක් නොමැතිව නඩු විභාග කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, මූලික පරීක්ෂණයකදී වාර්තාගත කරනු ලැබූ සාක්ෂි, අධි චෝදනාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, මූලික පරීක්ෂණයක් පැවැත්වීම, ඔහු විසින් විධානය කළ හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එය මූලික පරීක්ෂණයට අදාළ විය යුතුය.

(2) මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබ සිටින තැනැත්තකුට නීතිපතිවරයාගේ අනුමතය ඇතිව මිස ඇප නියම නොකළ යුතු ය.

(3) (2) වන ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, මේ නියෝගය යටතේ පැවැත්වෙන යම් නඩු විභාගයක දී අධිකරණය ඉදිරියෙහි චෝදනා කරනු ලබන සියළු තැනැත්තන් කැඳවීම, ඔවුන් සිරභාරයට ගැනීම, ඔවුන්ගේ රැකවරණය හෝ ඔවුනට ඇප නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම ඒ නඩු විභාගය පවත්වන අධිකරණය විසින් හෝ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් කළ හැකිය.

(4) යම් තැනැත්තෙක් සිරභාරයට ගනු ලැබීම ඒ තැනැත්තා විසින් මගහරින බව, පැනගොස් සැඟවී සිටින බව හෝ හොර ලෙඩ ගෙන සිටින විට අධිකරණය සෑහීමකට පත්වුහොත් මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගය ඒ තැනැත්තා නොපැමිණ සිටිය දී ආරම්භ කළ හැකි ය. *නැතහොත්* එසේ පවත්වාගෙන යා හැකිය.

(5) මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ලැබ සිටින යම් තැනැත්තකු විසින්, ඒ නඩු විභාගය ආරම්භ වන දිනට පෙර දින 30 ක් ඉක්ම නො විය යුතු යම් අවස්ථාවක, පැමිණිලි පක්ෂය විසින් කැඳවීමට අදහස් කරන සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශවල ද නඩු විභාගයේ දී උපයෝගී කර ගැනීමට බලාපොරොත්තු වන ලේඛනවල ද පිටපත් තමන්ට සපයන ලෙස මහාධිකරණය වෙත ලිඛිත ඉල්ලීමක් මගින් අයැද සිටිය හැකි අතර, ඒ සියලු ප්‍රකාශවල හෝ ලේඛනවල පමණක් පිටපත් ඒ තැනැත්තාට දිය යුතු යයි, අධිකරණය විසින් නියම කළ හැකි ය.

(6) මේ නියෝග යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඇතුළු ව මහාධිකරණය ඉදිරියෙහි වූ නඩු විභාගයක්, අවස්ථාවෝචිත පරිදි ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියෙහි හෝ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි නඩු විභාග සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිතාක් ඉක්මණින් පැවැත්විය යුතුය.

ප්‍රකාශ සාක්ෂි වශයෙන් ආවේශ කරගත හැකි බව

41. (1) හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ නඩු විභාගයක දී ඒ තැනැත්තා විසින් කරන ලද ප්‍රකාශයක් පාපොච්චාරණයක් වුව ද, නොවුව ද, එය කරන ලද අවස්ථාවේ දී එම තැනැත්තා සිටියේ පොලිස් නිලධරයකුගේ රැකවරණයේ වුව ද, නොවුව ද, එම ප්‍රකාශය මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දීම කරන ලද්දක් වුව ද, නොවුව ද, එම ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවේ නම් පමණක් ම ඔහුට විරුද්ධව ඔප්පු කළ හැකි ය :

එසේ වුව ද, ඒ ප්‍රකාශය, තනතුරින් සහකාර පොලිස් අධිකාරිවරයකුට වඩා පහළ නිලධරයකුට කරන ලද්දක් නම්, එවැනි කිසිම ප්‍රකාශයක් ඒ තැනැත්තාට විරුද්ධව ඔප්පු නොකළ යුතු ය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් (1) වන ඡේදය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව ම ඔප්පු කළ හැකි ය. ඔහු විසින් ම කරන ලද ප්‍රකාශයක් මේ නියෝගවල 31 වන නියෝගය යටතේ කරන ලද ප්‍රකාශයක් හැර වෙනත් සාක්ෂි මගින් වැදගත් විස්තර සම්බන්ධයෙන් එම ප්‍රකාශය තහවුරු කළ හැකි නම් පමණක් ම එම වරද සඳහා හවුලේ චෝදනා කරනු ලැබ සිටින වෙන යම් තැනැත්තකුට විරුද්ධව ද ඔප්පු කළ හැකි ය.

(3) (1) වන හෝ (2) වන ඡේදයේ සඳහන් යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන බව ඔප්පු කිරීමේ භාරය එය අදාළ නොවන බව තරයේ කියා සිටින තැනැත්තා සතු විය යුතුය.

(4) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ 25 වන, 26 වන සහ 27 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 110 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් (1) වන ඡේදයේ හෝ (2) වන ඡේදය යටතේ ඔප්පු කරනු ලැබිය හැකි ය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු බව

42. හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණවලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

රජයේ රස පරීක්ෂකවරයාගේ සහතිකය සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් විනාශ කිරීම.

43. (1) වරදක් සම්බන්ධයෙන් පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී, පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක හෝ ද්‍රව්‍යයක අනන්‍යතාව, සංයුතිය හෝ ස්වභාවය සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂකවරයාගේ, නියෝජ්‍ය රස පරීක්ෂකවරයාගේ හෝ සහකාර රස පරීක්ෂකවරයාගේ හෝ ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකුගේ හෝ අත්සන යටතේ වූවක් ලෙස සළකනු ලබන සහතිකයක්, එම නීති කෘත්‍යයේ දී සාක්ෂි දීම පිණිස ඒ තැනැත්තා නොකැඳවා ම, එම සහතිකයේ අඩංගු ප්‍රකාශයන්හි සත්‍යතාව පිළිබඳ ව තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

(2) යම් වරදක් සම්බන්ධයෙන් පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් තම භාරයේ තබා ගැනීම ආරක්ෂා රහිතය *නැතහොත්* කළ නොහැකි ය යන මතය රජයේ රස පරීක්ෂකවරයා, නියෝජ්‍ය රස පරීක්ෂකවරයා හෝ සහකාර රස පරීක්ෂකවරයා *නැතහොත්* ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු හෝ විසින් දරනු ලබන අවස්ථාවක, ඒ නිලධරයා විසින් අවශ්‍ය පරීක්ෂණය හෝ විශ්ලේෂණය කිරීමෙන් පසු, ඒ දෙය හෝ ද්‍රව්‍ය බැහැර කිරීම හෝ විනාශ කිරීම කළ හැකි ය.

(3) යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් (2) වන ඡේදයෙහි විධිවිධාන යටතේ බැහැර කරනු ලැබූ විට හෝ විනාශ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි රජයේ රස පරීක්ෂකවරයා, නියෝජ්‍ය රස පරීක්ෂකවරයා හෝ සහකාර රස පරීක්ෂකවරයා *නැතහොත්* ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු හෝ විසින් බැහැර කරනු ලැබූ හෝ විනාශ කරනු ලැබූ දෙය හෝ ද්‍රව්‍ය පිළිබඳව වාර්තාවක් තබාගත යුතු අතර, ඒ වාර්තාවේ හරය හෝ අන්තර්ගත කරුණු ඇතුළත්, එවැනි යම් නිලධරයකුගේ අත්සන යටතේ වූවක් සේ සළකනු ලබන සහතිකයක් යම් වරදක් සඳහා වූ යම් නීති කෘත්‍යයක දී සාක්ෂි දීම පිණිස ඒ නිලධරයා නොකැඳවා ම එම සහතිකයේ සඳහන් ප්‍රකාශවල සත්‍යතාව පිළිබඳව තීරණාත්මක සාක්ෂි විය යුතුය.

(4) මේ නියෝගයේ "වරද" යන්නෙන් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ හෝ VII වන පරිච්ඡේදය හෝ VIII වන පරිච්ඡේදය යටතේ වන යම් වරදක් අදහස් වේ.

## VII වන කොටස

### විවිධ

විවිධ බලතල

44. (1) මේ නියෝගය බල පැවැත්වෙන අතර තත්ත්වයෙන් සැරයන් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යම් සාමාජිකයෙකු විසින් හෝ තත්ත්වයෙන් ප්‍රධාන නැවියකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එකී භූමියෙහි සිටින යම් තැනැත්තකු හෝ තැනැත්තන්ට ඒ ස්ථානයෙන් ඉවත්ව යාමට අණ කළ හැකි ය. තව ද ඒ ආඥාව පිළිපැදීම අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ එක් එක් තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) නියමයක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ නියමයක් නිකුත් කරනු ලැබූ විට, යම් තැනැත්තකු ඒ නියමයට අනුකූලව ක්‍රියා නොකරන්නේ නම් හෝ, එම නියමයට අනුකූලව ක්‍රියා නොකිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙන්නේ නම් ඒ නිලධරයා විසින්, අවශ්‍ය විය හැකි යම් සහයක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ නියමය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර, ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තැබීමට සැළැස්විය හැකි ය.

(3) මේ නියෝගය බලපවත්නා කාලය තුළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 (1), (2) සහ (4) වන වගන්ති, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඇති යුතුකම

45. (1) වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු, එසේ අත් අඩංගුවට ගෙන රඳවා තබාගෙන ඇති කාල සීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුධ හමුදාධිපති, නාවුක හමුදාධිපති හෝ ගුවන් හමුදාධිපති විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් යටත් නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබිය හැකිය. තව ද, තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු දීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) (1) ඡේදය යටතේ අත් අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ තැනැත්තා මේ නියෝගයේ (1) වන ඡේදයේ සඳහන් යම් නිලධරයකු විසින් ඔහු රඳවා ගෙන හෝ අත් අඩංගුවේ තබාගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරදකට දින හතකට නොවැඩි කාලයක් එම නිලධරයාගේ තාවකාලික අත්අඩංගුවේ තබා ගත හැකි ය.

තොරතුරු ලබා ගැනීම හෝ භාණ්ඩ පරීක්ෂා කිරීමේ බලය.

46. (1) මේ නියෝගවල අඩංගු විශේෂ විධිවිධානවලට අගතියක් නොමැතිව, නිසි බලධාරියා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලීමක් කළ විටක, ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ යයි හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා හෝ ලබැනිමට හෝ පරීක්ෂා කරනු ලැබීමට, අවශ්‍ය හෝ යෝග්‍ය යයි බලධරයා හෝ ඉල්ලීමක් කරන තැනැත්තාත්තා හෝ අදහස් කරන්නා වූ ද, ඉල්ලීමෙහි සඳහන් බලධරයාට හෝ තැනැත්තාට යට කී තැනැත්තා විසින් සැපයිය යුතු ය. *නැතහොත්* ඉදිරිපත් කළ යුතු ය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම සන්තකයෙහි ඇති භාණ්ඩයක් සැපයුම හෝ ඉදිරිපත් කිරීම යම් කෙනෙකු විසින් පැහැර හැරියහොත් ඔහු යම් වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ නියෝගයේ "භාණ්ඩය" යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වෙයි.

මෝටර් වාහන පනතේ ඇතැම් විධිවිධානවලින් සන්නද්ධ හමුදාවල සාමාජිකයන් නිදහස් කිරීම

47. මහජන සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් මෝටර් වාහනයක් පදවන ලෙස නිසි බලධරයා විසින් බලය පවරනු ලැබ, ශ්‍රී ලංකා යුද හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු යම් මෝටර් වාහනයක් එසේ පදවන විට, මෝටර් වාහන පනත යටතේ සාදන ලද නියෝග අතුරෙන් 1955 ජූලි 8 වන දින අංක 10,815 දරන *ගැසට්* පත්‍රයෙහි පළ කරන ලද 1955 මෝටර් වාහන (මහ රැජිනගේ හමුදා නිදහස් කිරීමේ) නියෝගවල "අ" උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මෝටර් වාහන පනතේ විධිවිධානවලින් හා නියෝගවලින් ඔහු නිදහස් වන්නේය.

දිස්ත්‍රික් ලේකම්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධීකරණ නිලධරයෙකු විසින් ක්‍රියාත්මක කිරීම හෝ කිරීම කළහැකි බව

48 (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධීකරණ නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් පත් කළ හැකි ය.

(2) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධීකරණ නිලධරයකු ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් පත් කළ විට ඒ නිලධරයා විසින් ලිඛිත නීතියක් යටතේ හෝ අන් ලෙසකින් හෝ දිස්ත්‍රික් ලේකම් වෙත පැවරුණු හෝ පැනවුණු සියළු බලතල, කාර්යය හෝ කර්තව්‍ය ඒ ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවිය යුතුය; කළ යුතු ය; *නැතහොත්* ඉටු කළ යුතු ය. තව ද ඒ කාර්යය සඳහා ඒ ලිඛිත නීතියෙහි දිස්ත්‍රික් ලේකම් ගැන වූ සෑම සඳහන් කිරීමක් ම, ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධීකරණ නිලධරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගතයුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් නියමයක් මගින්, නියමයේ සඳහන් යම් ප්‍රදේශ කිසිවක් සඳහා (1) වන ඡේදය යටතේ පත් කරන ලද සම්බන්ධීකරණ නිලධරයන් විෂයෙහි අධීක්ෂණ කටයුතු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු ලෙස යම් තැනැත්තකු නමින් හෝ ධුරයෙන් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ සිය කාර්යය ඉෂ්ඨ කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධතා නිලධරයාට සහය වීම පිණිස අවශ්‍ය, යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයන් නමින් හෝ ධුරයෙන් ජනාධිපතිවරයා විසින් පත් කළ හැකි ය.

(5) මේ නියෝගය මගින් හෝ මේ නියෝග යටතේ හෝ ප්‍රධාන සම්බන්ධතා නිලධරයා වෙත පැවරුණු හෝ පැනවුණු හෝ වෙන්කර දෙනු ලැබූ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයා විසින් (4) වන ඡේදය යටතේ පත් කරන ලද යම් නියෝජ්‍ය නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(6) (3) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ යම් ප්‍රධාන සම්බන්ධනා නිලධරයකු විසින් හෝ (4) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකුගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් (5) ඡේදය යටතේ පවරනු ලැබ සිටින්නා වූ, යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධතා නිලධරයකු විසින් හෝ -

(අ) තමා අධීක්ෂණය කටයුතු කරන්නේ නම් සම්බන්ධීකරණ නිලධරයකු විෂයෙහි ද ඒ සම්බන්ධතා නිලධරයා වෙත පවරන ලද *නැතහොත්* පවරන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය. තවද

(ආ) තමා අධීක්ෂණ කටයුතු කරන්නේ නම් සම්බන්ධීකරණ නිලධරයකු විෂයෙහිලා ඒ සම්බන්ධතා නිලධරයා වෙත පනවන ලද *නැතහොත්* පවරන ලද බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉෂ්ඨ කිරීම හෝ කිරීම පිළිබඳව, ඒ සම්බන්ධීකරණ නිලධරයා වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන කරනු ලැබිය හැකි ය.

වගකීමෙන් ආරක්ෂා කිරීම

49. යම් හදිසි අවස්ථා නියෝගයක හෝ ඒ යටතේ කරන ලද යම් නියමයක හෝ විධානයක විධිවිධාන යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය මගින් හෝ එම අනුමැතිය ඇතිව හෝ මිස, කිසිම අධිකරණයක නොපැවරිය යුතු ය.

EOG 11 - 0289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.